## ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය - 2018

---

### 1.1 මතය

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ ("යෝජනා ක්‍රමය") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

යෝජනා ක්‍රමයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය යෝජනා ක්‍රමය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී, මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

යෝජනා ක්‍රමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම, පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, යෝජනා ක්‍රමය විසින් යෝජනා ක්‍රමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයන් සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස යෝජනා ක්‍රමයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ යෝජනා ක්‍රමයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ යෝජනා ක්‍රමයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, යෝජනා ක්‍රමය ක්‍රියා කර ඇති බව;
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව යෝජනා ක්‍රමය කටයුතු කර ඇති බව; සහ
- යෝජනා ක්‍රමයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| අ) 2010 අංක 1 දරණ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ රෙගුලාසිවල 9.4 වගන්තිය | සාමාජික ආයතනයේ බලපත්‍රය අවලංගු කළ දින සිට මාස හයක් ඇතුළත නිශ්චිතව දක්වා ඇති සීමාවන් තුළ වන්දි ගෙවනු ලැබේ. කෙසේ වුවද, 2018 මාර්තු 05 දින බලපත්‍රය අවලංගු කරන ලද සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි තැන්පත්කරුවන් සඳහා ගෙවිය යුතු වන්දි මුදලින් සියයට 7 ක් නියෝජනය කරමින් රු.116,773,925 ක් වූ වන්දි මුදලක් පමණක් මාස හයක් ඇතුළත ගෙවා තිබුණි. | ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයට විකල්ප ක්‍රියා පටිපාටි අනුමත කිරීම් කිහිපයක් ලබා ගැනීමට සිදු වූ අතර කාර්ය මණ්ඩලය සහ ස්වයංක්‍රීය පද්ධති වැනි දැඩි සම්පත් බාධාවන්ට මුහුණ දීමට සිදුවිය. තවද, සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී විසින් තැන්පත්කරුවන් පිළිබඳ සපයන ලද ප්‍රමාණවත් නොවූ තොරතුරු ප්‍රධාන බාධාවක් වූ අතර, ඔවුන් මේ දක්වා 11 වතාවක් සංශෝධිත ප්‍රධාන ලිපිගොනු ලබා දී තිබුණි.<br>ඉහත කරුණු හේතුවෙන්, මාස හයක කාල සීමාව තුළ සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි තැන්පත්කරුවන් අඩු ප්‍රමාණයක් සඳහා වන්දි ගෙවීමට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයට සිදුවිය.<br>කෙසේ වුවද, නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව (ආර්. ඊ. ඩී) විසින් එවැනි සම්පත් අවහිරතා මෙන්ම අනුකූල නොවීම පිළිබඳව මුදල් මණ්ඩලයට දන්වා තිබුණි. | නියමිත කාලය තුල ගෙවීමට නිර්දේශ කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ)මුදල් මණ්ඩලයේ අනුමත වන්දි ක්‍රියාපටිපාටියේ 1.3.1 (ඇ) වගන්තිය | අදාළ නියාමක (බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ) විසින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය මඟින් ලබා දී ඇති ආකෘතියට අනුව, නියාමක සහතික කළ තැන්පත්කරුවන්ගේ ලැයිස්තුව ක්‍රියාකාරී කමිටුවට ඉදිරිපත් කළ යුතුය. සහතික කරන ලද තැන්පත්කරුවන්ගේ ලැයිස්තුවේ නිරවද්‍යතාවය සත්‍යාපනය කිරීම අදාළ නියාමක විසින් සෘජුවම හෝ විගණකවරයෙකු හරහා සාමාජික ආයතනයක බලපත්‍රය අවලංගු කළ දින සිට මාස දෙකකට වඩා ප්‍රමාද නොවන කාල සීමාව තුල කළ යුතුය. කෙසේ වෙතත්, ඉහත තැන්පත්කරුවන්ගේ ලැයිස්තුව නියාමක (බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ) විසින් සහතික කර නොතිබුණි.<br>එවැනි නියාමක සහතික කළ තැන්පත්කරුවන්ගේ ලැයිස්තුවක් ඉදිරිපත් කිරීමට ඇති නොහැකියාව පිළිබඳව බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් මතු කරන ලද කරුණු සැලකිල්ලට ගනිමින් විකල්ප ක්‍රියා පටිපාටීන් අනුගමනය කිරීමට මුදල් මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. | කෙටුම්පත් වාර්තාවේ සඳහන් කරුණු සමඟ අපි එකඟ වෙමු. | ක්‍රියාවලිය වේගවත් කිරීමට නිර්දේශ කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

(අ) සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය, බදු ගෙවීමෙන් පසු රුපියල් මිලියන 7,751.42 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ බදු ගෙවීමෙන් පසු රුපියල් මිලියන 9,865.96 ක අතිරික්තයක් ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රුපියල් මිලියන 2,114.54 ක් වූ පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු ප්‍රතිපාදන හා වන්දි සඳහා ප්‍රතිපාදන ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයනට අනුව, 2018 දෙසැම්බර් 31 දින වන විට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාර යෝජනා ක්‍රමයේ අරමුදලේ ශේෂය ඉකුත් වසර අවසානයේ තිබූ රුපියල් මිලියන 44,123.26 ක අනුරූප ශේෂයට සාපේක්ෂව රු. මිලියන 7,751.42 කින් හෙවත් සියයට 17.56 කින් වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අරමුදලෙන් ගෙවීම් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ අංක 9.10 දරණ රෙගුලාසි ප්‍රකාරව, මුදල් මණ්ඩලය විසින් අත්හිටුවීම / අවලංගු කිරීම පිළිබඳව 2012 ජනවාරි 01 දින හෝ ඊට පසුව නියෝග කර ඇති විටකදී වන්දි ගෙවීම බලාත්මක වේ. ඒ අනුව, සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (සී.අයි.එෆ්.එල්) සහ ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් හි බලපත්‍ර පිළිවෙලින් 2018 මාර්තු 05 සහ 2018 ජූලි 25 දින සිට මුදල් මණ්ඩලය විසින් අවලංගු කරන ලදී. ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ වන්දි මුදල් රු.597,613,713 ක් තැන්පත්කරුවන් 1340 දෙනෙකුට ගෙවා ඇත. | කෙටුම්පත් වාර්තාවේ සඳහන් කරුණු සමඟ අපි එකඟ වෙමු. | සුදුසුකම් ලත් තැන්පත්කරුවන්ට ගෙවීම් ක්‍රියාවලිය වේගවත් කිරීමට නිර්දේශ කරමි. |

### 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මෙම යෝජනා ක්‍රමය මගින් ප්‍රාථමික අලෙවිකරුවකු සමඟ රුපියල් මිලියන 147.05 ක මුදලකට 2016 මාර්තු 31 දිනට කල් පිරෙන ප්‍රතිවර්ත ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුමක රුපියල් මිලියන 137.18 ක මුදලක් 2015 අප්‍රේල් 01 දින ආයෝජනය කර ඇත. ප්‍රාථමික අලෙවිකරු විසින් ඉහත ආයෝජනය සඳහා පාදක වූ සුරැකුම්පත්, ඒ වෙනුවෙන් කිසිදු සුරැකුම්පතක් ආදේශ නොකර ඉවත් කර ගෙන තිබුණි. | කෙටුම්පත් වාර්තාවේ සඳහන් කරුණු සමඟ අපි එකඟ වෙමු. | ආයෝජන මාර්ගෝපදේශයන්ට අනුකූල වීමට නිර්දේශ කරමි. |

| | |
|---|---|
| (ආ) මහ බැංකුවේ මුදල් මණ්ඩලය 2015 දෙසැම්බර් 04 දින ගනු ලැබූ මණ්ඩල තීරණයට අනුව, සුරැකුම්පත් නොමැතිව ඉහත ආයෝජනය ප්‍රතිආයෝජනය කිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව, ඉහත සඳහන් ආයෝජනය සඳහා රුපියල් මිලියන 144.25 ක් වූ හානිකරණයක් 2015 දෙසැම්බර් 31 දිනට යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශනවල සිදු කර තිබුණි. 2018 දෙසැම්බර් 31 දක්වා වුවද, ඉහත ආයෝජනය ප්‍රතිආයෝජනය කර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දක්වා ඉහත ආයෝජනය සඳහා එකතු වූ පොළිය රු. මිලියන 39.04 කි. | කෙටුම්පත් වාර්තාවේ සඳහන් කරුණු සමඟ අපි එකඟ වෙමු. |